# කල්‍යාණ මිත්‍ර සේවනය

දන්කන්දේ ධම්මරතන හිමි

සියළුම හිමිකම් ඇවිරිණි

# කල්‍යාණ මිත්‍ර සේවනය

සමාජයේ සිටිනා සාමාන්‍ය කෙනෙකුට තනිව ජීවත් විය නො හැක. එම නිසා, නෑදෑයන්, හිත-මිත්‍රයන්, අසල්වාසීන් ආදී අන් අය ඇසුරු කිරීමට සිදු වේ. මෙසේ අන් අයකු ඇසුරු කරන විට, ඔවුනොවුන් ගේ ගති-පැවතුම්, සිතුම්-පැතුම්, ආකල්ප, චරිත ස්වභාවයන් ආදිය ඔවුනොවුන්ට බලපෑමක් කරන, එසේම ඒවාට තමනුත් ඇබ්බැහි වන, අවස්ථා එමට ඇත. මෙය යහපත් පැත්තට මෙන් ම අයහපත් පැත්තට ද සිදුවන අවස්ථා තිබේ.

පාප මිත්‍රයන් ගේ ඇසුර නිසා, සමහර විට ශ්‍රද්ධා සම්පන්න අය අශ්‍රද්ධාවත් පුද්ගලයන් බවට පත් වෙති; සිලවත් අය දුශ්ශීල වෙති. ගුණ ගරුක අය ගුණ හීන අය වෙති. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම වැනි කාය දුශ්චරිතයන් ගෙන් ඈත් වූවෝ, එවැනි කාය දුශ්චරිත කරන්නන් බවට පත් වෙති; බොරු-කේලාම්-පරුස වචන-සම්පප්ප්‍රලාප වලින් වෙන් වූ අය, වචී දුශ්චරිත කරන්නෝ වෙති; දැඩි ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ඨිය ආදියෙන් තොර පිරිසිදු මනසක් ඇති ව සිටින්නෝ, මනෝ දුශ්චරිත වලින් යුතු පුද්ගලයන් බවට පත් වෙති; සුරා-මත්ද්‍රව්‍ය-රේස් දැමීම වැනි සූදුවලින් ඈත්ව සිටින්නෝ ඒවාට ඇබ්බැහිවන්නන් බවට පත් වෙති; ධර්මකාමී පුද්ගලයෝ ධර්මයෙන් ඈත් වෙති; දානාදි පුණ්‍ය කර්මයන් කරන්නෝ අකුශල් කරන පාපකාරී පුද්ගලයන් බවට පත් වෙති; සසර දුකින් මිදීමට කටයුතු කරන්නෝ, ඉන් ඈත්ව සසරෙහි ම නැවත නැවත උපදවන සංස්කාරවල පැටළෙති.

"නිහීයති පුරිසෝ නිහීන සේවී" (අංගුත්තර නිකාය) - පාපකාරී පුද්ගලයන් ඇසුරු කරන්නා ද පාපකාරී පුද්ගලයකු බවට පත් වන බව බුදුරජාණන් වහන්සේ දක්වා ඇත.
එසේම ව්‍යග්ඝ පජ්ජ - උජ්ජය - සිඟාල වැනි සූත්‍ර වල පාප මිත්‍ර ඇසුර "අපාය මුඛයක්" ලෙසින් බුදුරජාණන් වහන්සේ වදාරා

තිබේ. "අපාය මුඛ" යනුවෙන් දක්වෙන්නේ, පාප මිත්‍ර ඇසුර යනු හානියට පමුණුවන දොරටුවක් යන්නයි. පාප මිත්‍ර ආශ්‍රය නිසා අනර්ථයක් ම, අයහපතක් ම, අවැඩක් ම සිදුවීමට බොහෝ දුරට ඉඩ ඇත. එමඟින් කෙනෙකුගේ මේ ලෝකාර්ථය ද විනාශ වන්නේ ය, පරලෝකාර්ථය ද නැසෙන්නේ ය. නිර්වාණ පරමාර්ථය ද නැති වන්නේ ය. පාප මිත්‍ර ඇසුර බොහෝ විට කුශල ධර්මයන්ට අන්තරාය පිණිස, ධම්මානුධම්ම ප්‍රතිපදාවන්ට අන්තරාය පිණිස, සසර දුකින් මිදීමට අන්තරාය පිණිස පවතින අතර ම, එය සසර දුකෙහි ගිල්වීමට ම බොහෝ විට හේතු වේ.

මෙම නිසාම, බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කොට තිබේ:

> න භජේ පාපකේ මිත්තේ
> න භජේ පුරිසාධමේ
> භජේථ මිත්තේ කල්‍යාණේ
> භජේථ පුරිසුත්තමේ *(ධම්ම පදය - ගාථා 78)*

පාප මිත්‍රයන් ඇසුරු නො කරන්න. අධම පුරුෂයන් ආශ්‍රය නො කරන්න. කළණ මිතුරන්, උතුම් මිනිසුන් ආශ්‍රය කරන්න යනු ඉහත ගාථාවෙන් දක්වෙන කෙටි අදහස ය.

> අසේවනාච බාලානං
> පණ්ඩිතානං ච සේවනා ..... *(මහා මංගල සූත්‍රය)*

මෝඩ, පාපකාරී පුද්ගලයන් ඇසුරු නො කිරීමත්, පණ්ඩිත පුද්ගලයන් ඇසුරු කිරීමත් මංගල කරුණක් බව මංගල සූත්‍රයේ දක් වේ.

> චරං චේ නාධිගච්ඡෙය්‍ය
> සෙය්‍යං සදිසිමත්තනෝ
> ඒකචරියං දළ්හං කයිරා
> නත්ථි බාලේ සහායතා *(ධම්මපද ගාථා 61)*

තමාට සමාන හෝ තමාට වඩා උසස් අයකු ආශ්‍රය කිරීමට නැත්නම්, පාප මිත්‍රයන් ආශ්‍රය කරනවාට වඩා, තනිව හැසිරීම උතුම් බව එම ගාථාවෙන් දක්වෙන සරල අදහස ය.

අද සමාජයේ සිටිනා බොහෝ අය කල්‍යාණ මිත්‍රයන් වශයෙන් සැළකිය හැකි අය නො වන නිසා, සමාජයෙන් කොන්වීම වළක්වා ගැනීම සඳහා පාපකාරී පුද්ගලයන් අතේ දුරින් තබා ගෙන ඇසුරු කළ හැකි ය. එහෙත් ඔවුන් ගේ අපිරිසිදු කාය කර්ම ආදිය කිසිසේත් ම තමා ළං නො කර ගත යුතු ය. එසේ ම ඔබගේ වචනය ඔවුන් අදහන්නේ නම්, ඔවුන් සුමගට ගැනීම ඔබට කළ හැකි නම්, එසේ කිරීම ඉතා අගනේ ය.

"යානි කානිචි භික්ඛවේ, භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතෝ උප්පජ්ජන්ති, නො පණ්ඩිතතෝ.
යේ කේචි උපසග්ගා උප්පජ්ජන්ති, සබ්බේ තේ බාලතෝ උප්පජ්ජන්ති, නො පණ්ඩිතෝ
යේ කේචි උපද්දවා උප්පජ්ජන්ති, සබ්බේ තේ බාලතෝ උප්පජ්ජන්ති, නො පණ්ඩිතෝ" *(අංගුත්තර නිකාය)*

යමකු ඇසුරු කිරීම නිසා යම්කිසි කරදරයක්, දුකක්, විපතක්, බියක් උපදිනවා නම් ඒ සියල්ල ම උපදින්නේ බාල (මෝඩ) පාපකාරී පුද්ගලයන් නිසා ය. පණ්ඩිතයකු ගේ ඇසුරෙන් එවැන්නක් සිදු නො වේ. ඉහත පාඨයේ සරල අදහස එය යි.

මෙම නිසා පාප මිත්‍රයා කවරෙක් ද, කල්‍යාණ මිත්‍රයා කවරෙක් ද කියා හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

## පාප මිත්‍රයා හඳුනා ගන්නේ කෙසේද ?

1. "තීහි භික්ඛවේ ධම්මේහි සමන්නාගතෝ බාලෝ වේදිතබ්බෝ. කතමේහි තීහි ? කාය දුච්චරිතේන, වචී දුච්චරිතේන, මනෝ දුච්චරිතේන" (අංගුත්තර නිකාය).

කරුණු තුනකින් සමන්නාගත බාලයා (මෝඩ, පාප මිතුරා) දත යුතු ය. ඒ කවර තුණකින් ද ? කාය දුශ්චරිතයෙන්, වචී දුශ්චරිතයෙන් හා මනෝ දුශ්චරිතයෙනි.

2. "තීහි භික්ඛවේ ධම්මේහි සමන්නාගතෝ බාලෝ වේදිතබ්බෝ. කතමේහි තීහි ? අයෝනිසෝ පඤ්හං කත්තා හෝති, අයෝනිසෝ පඤ්හං විස්සජ්ජේතා හෝති, පරස්ස ඛෝ පන යෝනිසෝ පඤ්හං විස්සජ්ජිතං නාබ්භනුමෝදිතා හෝති."

බාලයා දත හැකි කරුණු 3 කි. නුනුවණින්, මෝඩ කමින් ප්‍රශ්න අසයි. එසේම මෝඩ විධියට ප්‍රශ්න විසඳයි. අන් අය නුවණින් විසඳන ලද ප්‍රශ්න සතුටින් නො පිළිගනී. (අංගුත්තර නිකාය)

3. "තීණිමානි භික්ඛවේ බාලස්ස බාල ලක්ඛණානි, බාල නිමිත්තානි, බාල අපදානානි. කතමානි තීණි ? ඉධ භික්ඛවේ බාලෝ දුච්චින්තිච චින්තීච හෝති, දුබ්භාසිත භාසී, දුක්කත කම්මකාරී ..."

බාලයකුගේ ලක්ෂණ, නිමිති, චරිත 3 ක් ඇත. එනම් බාලයා නපුරු සිතිවිලි සිතයි. නපුරු බස් කියයි. නපුරු ක්‍රියා කරයි. (අංගුත්තර නිකාය)

මෙලෙසින් පාප මිත්‍රයා හඳුනා ගත හැකි වුවත්, අද සමාජයේ සිටින කුශල් නො කරන, අන් අය කුශල් කිරීමෙන් වළක්වා ලනු

ලබන, අකුසල් කරන, අන් අය අකුශල් කිරීමට පොළඹවන, සුරා සූදුවෙහි නියැලුණ, ස්ත්‍රී ධූර්ත ආදීන්, එවැනි ම පාපකාරී පුද්ගලයන් සළකන්නේ ඔවුන් තමාගේ කල්‍යාණ මිත්‍රයන් ලෙස ය.

කෙනකු ඇසුරු කිරීම නිසා ඔබ ගේ ශ්‍රද්ධාව අඩු වනවා නම් හෝ නැති වී යනවා නම් ඔහු කළණ මිතුරකු වශයෙන් සැළකීම නුසුදුසු ය. ඔබගේ ශීල ගුණය පිරිහීමකට පත්වනවා නම් හෝ නැති වී යනවා නම්, ඔබගේ පරිත්‍යාගශීලී භාවය, ඔබගේ ප්‍රඥාව, ඔබගේ ධර්මමය බහුශ්‍රැත භාවය අඩු වීමකට හෝ නැති වීමකට පත් වනවා නම් එවැන්නන් ගේ ඇසුර පාපමිත්‍ර සේවනයක් සේ සැළකිය යුතු ය.

## මිත්‍ර ප්‍රතිරූපකයන්

මිත්‍ර වේශයෙන් එන පාපකාරී මිත්‍රයන් හෙවත් මිත්‍ර ප්‍රතිරූපකයන් හඳුනා ගෙන සිටීම ද ඉතා වැදගත් ය. මිතුරු වෙසින් පැමිනෙන එවැනි අමිත්‍රයන් 4 දෙනකු සිටිනා බව සිගාලක සූත්‍රයේ (දීඝ නිකාය) බුදුරජාණන් වහන්සේ දක්වා ඇත.

"චත්තාරෝ මේ ගහපතිපුත්ත අමිත්තා මිත්තපතිරූපකා වේදිතබ්බා :

අඤ්ඤදත්ථුහරෝ අමිත්තෝ මිත්ත පතිරූපකෝ වේදිතබ්බෝ
වචීපරමෝ අමිත්තෝ මිත්ත පතිරූපකෝ වේදිතබ්බෝ
අනුප්පියභාණී අමිත්තෝ මිත්ත පතිරූපකෝ වේදිතබ්බෝ
අපාය සහායෝ අමිත්තෝ මිත්ත පතිරූපකෝ වේදිතබ්බෝ

1. අඤ්ඤදත්ථු හර මිත්‍ර ප්‍රතිරූපකයා :
   - මිතුරා ගෙන් කුමක් හෝ හැර ගෙන යාමට ම සිතන්නා.
   - මිතුරාට සුළු දෙයක් දී බොහෝ දේ බලාපොරොත්තු වන්නා.
   - තමාට කරදරයක් වූ විට පමණක් ආශ්‍රය කිරීමට එන්නා.

තමන්ගේ ම ප්‍රයෝජනය සඳහා පමණක් ම ඇසුරු කරන්නා.

2. වචී පරම මිත්‍ර ප්‍රතිරූපකයා :
- යම් උදව්වක් ඉල්ලන විට ඉස්සර ඉල්ලුවා නම් දෙන්නට තිබුණා කියා අතීතයෙන් සංග්‍රහ කරන්නා.
- තව ටික කලකින් නම් කරන්නට තිබුණා, දැන් නම් හරි අමාරුයි කියා අනාගතයෙන් සංග්‍රහ කරන්නා.
- නිරර්ථක හිස් වචන වලින් පමණක් සංග්‍රහ කරන්නා.
- වර්තමාන ක්‍රියාවන්හි වැරැදි ව්‍යසන ආදිය පමණක් දක්වන්නා.

3. අනුප්පියභාණී මිත්‍ර ප්‍රතිරූපකයා :
- තමා පවක් කළත් එය හොඳ යැයි කියන්නා
- තමා පිනක් කළත් එය හොඳ යැයි කියමින් පවටත් පිනටත් දෙකට ම හොඳ කියන්නා.
- ඉදිරියේ දී ගුණ කියන, නැති තැන අගුණ කියන්නා.

4. අපාය සහාය මිත්‍ර ප්‍රතිරූපකයා :
- රහමෙර පානය සඳහා යහළු වන්නා.
- නො කල්හි වීථි සංචාරයෙහි යෙදීම පිණිස යහළු වන්නා.
- නැටුම්, ගැයුම් බැලීමට යාම සඳහා යහළු වන්නා.
- දූ කෙළියෙහි යෙදීමට යහළු වන්නා.

## අනගාරික පාප මිත්‍රයන්

ගිහි පාප මිත්‍රයන් සේ ම, පැවිදි වූ පාප මිත්‍රයන් ද හඳුනා ගැනීම සුදුසු වේ.

"පඤ්චහි භික්ඛවේ ධම්මෙහි සමන්නාගතෝ භික්ඛුමිත්තෝ න සේවිතබ්බෝ. කතමෙහි පඤ්චහි ? කම්මන්තං කාරේති ......"
අංග 5 කින් යුතු පැවිදි අමිත්‍රයා සේවනය නො කළ යුතු ය.

1. භික්ෂූන් ට අයෝග්‍ය විවිධ ගිහියන් කරන කටයුතු වල යෙදෙන,
2. සංඝයා අතර කලහ විවාද අධිකරණ ඇති කරවන,
3. විනය ගරුක භික්ෂූන් ට විරුද්ධ වන,
4. නිතර දීර්ඝ චාරිකාවන් හි යෙදෙන,
5. කලින් කල සුදුසු පරිදි දහම් දෙසා තමා වෙත එන අයට - යහපතක් කිරීමට අපොහොසත් වන අය සේවනය නො කළ යුතු බව අංගුත්තර නිපාතයේ "භික්ඛුමිත්ත සූත්‍රයේ" දැක්වේ.

යම් පැවිදි කෙනකු ඇසුරු කිරීමෙන් මෙලොව යහපත, පරලොව යහපත, නිර්වාණ යහපත සළසා ගැනීමට අනුග්‍රහයක් ලැබෙනවා වෙනුවට, යම් යම් දේ සම්බන්ධව තමා තුළ නැති ලෝභය පවා දියුණු වනවා නම්, නැති ද්වේශය පවා වැඩි වනවා නම්, "මම" "මගේ" ආදී මමායනික හැඟීම් සිත තුළ කා වැදී යනවා නම්, සසර දිග් ගැස්සීමට හේතු වන කරුණු සැළසේ නම්, එවැන්නකු අනගාරික කළණ මිතුරකු ලෙස සැළකිය හැකිදැ'යි ඥානාන්විතව සිතා බැලීම ප්‍රඥාගෝචර ය.

## කල්‍යාණ මිත්‍රයකු හඳුනා ගන්නේ කෙසේද ?

දැන් අපි කල්‍යාණ මිත්‍රයකු හඳුනා ගන්නේ කෙසේදැ'යි බලමු.

කල්‍යාණ සත්පුරිස පුද්ගලයා "සුචින්තික චින්තීච හෝති, සුභාසිත භාසී, සුකත කම්මකාරී" යහපත් සිතුවිලි සිතයි, යහපත් වදන් කියයි, යහපත් ක්‍රියා සිදු කරයි.

කල්‍යාණ සත්පුරිස පුද්ගලයා "කාය සුචරිතේන සමන්නාගතෝ හෝ ති, වචී සුචරිතේන, මනෝ සුචරිතේන" කාය සුචරිතයෙහි යෙදෙයි, වචී සුචරිතයෙන් යුතු වෙයි. මනෝ සුචරිතයෙන් සමන්නාගත වෙයි.

යම් අයකු ඇසුරු කිරීමෙන් තමා තුළ නැති ශ්‍රද්ධාව ඇති වේ නම්, තිබෙන ශ්‍රද්ධාව වැඩි-දියුණු වේ නම්, මෙලෙසින් ම තමා තුළ නැති ශීලය, පරිත්‍යාගශීලී භාවය, ධර්මශ්‍රැත භාවය, ප්‍රඥාව ඇති වේ නම් හා තමා තුළ ඇති එම යහපත් ගුණ ධර්ම තව තවත් වැඩේ නම් ඔහු සැබැවින් ම කල්‍යාණ මිත්‍රයෙකි.

"නාහං භික්ඛවේ අඤ්ඤං ඒක ධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නාවා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවේ කල්‍යාණමිත්තතා."

මහණෙනි, කල්‍යාණ මිත්‍ර සම්පත්තිය තරම්, උපන් අකුශල් පිරිහී යන, නූපන් කුශල ධර්ම උපදින වෙනත් එකම ධර්මයක්වත් මම නො දකිමි; මහණෙනි කළණ මි ්‍රයන් ඇත්තාහට නූපන්නා වූ ද කුශල ධර්මයෝ උපදිත්, උපන් ාවූ ද අකුශල ධර්මයෝ පිරිහෙත්. (අංගුත්තර නිකාය).

"කල්‍යාණමිත්තතා භික්ඛවේ මහතෝ අත්ථාය සංවත් ි"

මහණෙනි, කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මහත් අර්ථය පිණිස පවතී.
(අංගුත්තර නිකාය)

මෙවැනි මහත් අර්ථ සිද්ධියක් සළසා දෙනු ලබන, මෙලොව යහපත, පරලොව යහපත, නිර්වාණ ශාන්තිය ලබා දීමට උපකාර වන කල්‍යාණ මිත්‍රයන් 4 දෙනකු ගැන සිගාලක සූත්‍රයේ කරුණු දැක් වේ.

"චත්තාරෝ 'මේ ගහපතිපුත්ත මිත්තා සුහදා වේදිතබ්බා.

1. උපකාරෝ මිත්තෝ සුහදෝ වේදිතබ්බෝ.
2. සමානසුඛදුක්ඛෝ මිත්තෝ සුහදෝ වේදිතබ්බෝ
3. අනුකම්පකෝ මිත්තෝ සුහදෝ වේදිතබ්බෝ
4. අත්ථක්ඛායී මිත්තෝ සුහදෝ වේදිතබ්බෝ

උපකාරක මිත්‍රයා
- බීමත් වී වැටී සිටින වැනි කරදරයකට පත් වී සිටිනා මිතුරා රැක ගනී.
  මිතුරා ගේ ධනය ආරක්ෂා කරයි.
- බියට පත් මිත්‍රයාට පිහිට වෙයි.
- අවශ්‍ය කටයුත්තකදී අවශ්‍ය ප්‍රමාණයටත් වඩා උදව් උපකාර කරයි.

සමාන සුඛ දුක්ඛ මිත්‍රයා
- මිතුරාට රහස් නො සඟවයි
- මිතුරාගේ රහස් අන් අයට නො කියයි.
- විපතක දී අත් නො හරියි.
- මිතුරා වෙනුවෙන් ජීවිතය පරදුවට තබා වුව ද කටයුතු කරයි.

අනුකම්පක මිත්‍රයා
- මිතුරාගේ විපතක්, පිරිහීමක් වූ කල, ඒ ගැන සංවේගයට පත් වෙයි; ඒ සඳහා කළ හැකි සෑම උපකාරයක් ම කරයි.
- මිතුරාගේ දියුණුවේ දී අවංකව ම සතුටු වෙයි.
- මිතුරාගේ අගුණ කියන විට එය වළක්වාලයි; ඔහුගේ ගුණ කියා මිතුරා ගේ කීර්තිය රැක දෙයි.
- මිතුරා ගේ ගුණ කියන අයට ප්‍රශංසා කරයි.

අත්ථක්ඛායී මිත්‍රයා
- මිත්‍රයා පවින්, අපරාධ වලින්, දුච්චරිත වලින් වළක්වයි.
- මිතුරා පුණ්‍ය ක්‍රියාවල යොදවයි.
- නො දත්, අසා නැති ධර්මය ඇසීමට සළස්වයි.
- සුගතිගාමී මාර්ගය, නිර්වාණ මාර්ගය කියා දෙයි.

# අනගාරික කල්‍යාණ මිත්‍රයා

ගිහි කල්‍යාණ මිත්‍රයන් මෙන් ම, පැවිදි වූ කල්‍යාණ මිත්‍රයන් සේ සැළකිය යුතු අය ද සිටිති. මෙම අනගාරික කල්‍යාණ මිත්‍රයා බොහෝ විට අත්ථක්ඛායී මිත්‍රයකු ලෙස සැළකිය හැකි ය.

"පියෝ ච ගරු භාවනියෝ
වත්තාච වචනක්ඛමෝ
ගම්භීරංච කථං කත්තා
නො චට්ඨානේ නියෝජයේ"

අනගාරික කල්‍යාණ මිත්‍රයකු තුළ පවත්නා ලක්ෂණ එම ගාථාවෙන් දැක් වේ. ප්‍රිය වූ, මනාප වූ, ගරු භාවනීය වූ, ඉවසන සුළු වූ, ගම්භීර දහම් කරුණු කියා දෙන්නා වූ, අයහපතෙහි නො යෙදවන්නා වූ පැවිදි කල්‍යාණ මිත්‍රයා, ඔහු ඇසුරු කරන අය අධි ශීලයෙහි පිහිටුවා ලීමට උපකාර කරයි; අධි චිත්තයෙහි, අධි ප්‍රඥාවෙහි පිහිටුවාලීමට උපකාර කරයි; සතර සතිපට්ඨාන ධර්මයන්හි යොදවාලයි; සතර සම්මප්පධාන ධර්මයන්හි යොදවාලයි; සතර ඍද්ධිපාද ධර්මයන්හි, පංච ඉන්ද්‍රිය ධර්මයන්හි, පංච බල ධර්මයන්හි, සත්ත බොජ්ඣංග ධර්මයන්හි, ආර්ය අෂ්ඨාංගික මාර්ගයන්හි යොදවා ලනු ලබයි.

මේ ලෝකාර්ථය සඳහා කරුණු පෙන්වා දෙයි. පරලොව යහපත, පරලෝකාර්ථය සඳහා කරුණු කියා දෙයි. සමථ භාවනාවන්හි යොදවාලයි; විදර්ශනා භාවනාවන්හි යොදවාලනු ලබයි. සංසාර විමුක්තිය සඳහා අවශ්‍ය ධර්ම කරුණු පෙන්වා දෙයි.

සියළුම සංස්කාර අනිත්‍ය බව, දුක් බව, සියළුම ධර්මයන් අනාත්ම බව පැහැදිලි කර දෙයි. පටිච්ච සමුප්පාද ධර්මයන්, හේතු-ඵල ධර්මයන් විස්තර කර දෙයි; දුක්ඛ සත්‍යය - සමුදය සත්‍යය - දුක්ඛ නිරෝධ සත්‍යය - දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය අවබෝධ කරවාලනු ලබයි.

කාම-භව-දිට්ඨි-අවිජ්ජා ආදී ආශ්‍රව ධර්ම, ඒවායේ සමුදය, ඒවායේ නිරෝධය, ඒවා නිරුද්ධ කිරීමේ මාර්ගය පෙන්වා දෙයි.

දුක පිරිසිඳ දත යුතු ය, සමුදය වූ තණ්හා අවිජ්ජා පහකළ යුතු ය, විජ්ජා, විමුත්ති හා නිර්වාණය සාක්ෂාත්සාත් කළ යුතු ය, සමථ-විදර්ශනා ආදී මේ මේ ධර්මයෝ වැඩිය යුතු ය කියා ඒවා පෙන්නුම් කර දෙයි.

පඤ්චුපාදානක්ඛන්ධ - ෂ ධාතු - ෂ ඵස්සායතන - නාම රූප ආදී ධර්මයන්, ඒවායේ සමුදය - නිරෝධය - නිරෝධ ගාමිණී පටිපදාව, ඒවායේ ආශ්වාදය, ආදීනවය, ඒවා කෙරෙහි පවත්නා ඇලීම-බැඳීම අයින් කර ගැනීම නම් වූ නිස්සරණය පැහැදිලි ව අවබෝධ කරවාලනු ලබයි.

සසරෙහි රැඳී සිටීමේ භයානක කම, සසරෙහි රැඳී සිටීමේ ආදීනවය, සංස්කාර කෙරෙහි කළකිරිය යුතු බව, සංස්කාර කෙරෙහි විරාගය ඇති කර ගත යුතු බව, සංස්කාර කෙරෙහි පවත්නා උපාදානය අත් හළ යුතු බව පෙන්වා දෙයි.

ශීල ආදී සත්ත විසුද්ධීන්, අනිත්‍ය ආදී අනුපස්සනාවන්, උදයව්‍යයාදී විදර්ශනා ඥාන, කාමරාග ආදී සංයෝජන ධර්මයන් නැති කර ගැනීම්, ධ්‍යාන-මාර්ග-ඵල වැනි ධර්මයන් ලබා ගැනීම් ආදිය ගැන දතයුතු කරුණු අවබෝධ කරවා දෙයි; සසර දුකින් මුදවාලනු ලබයි.

මෙම නිසා ම, මුළු බුද්ධ ශාසනයම රඳා පවත්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මත බව බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ. ඉහළ ම කල්‍යාණ මිත්‍රයා බුදුරජාණන් වහන්සේ ය. අද කාලයේ නම්, රහත් හෝ වෙනත් මාර්ග-ඵල ලාභී ආර්යයන් ඉහළ ම කල්‍යාණ මිත්‍රයන් වේ. මෙවැන්නකු නො මැති නම්, ශීල ආදී ගුණ සම්පන්න, සසර දුකින් මිදීමට අවංකව ම උත්සාහ ගන්නා, ඒ සඳහා අවශ්‍ය

ධර්ම කරුණු කියා දිය හැකි ධර්ම බහුශ්‍රැත භාවයකින් හෙබි අයකු කළණ මිතුරකු ලෙස සැළකිය හැකි ය.

"චත්තාරෝමේ භික්ඛවේ, ධම්මා භාවිතා බහුලීකතා සෝතාපත්ති-සකදාගාමී-අනාගාමී-අරහත්තඵල සච්ඡිකිරියාය සංවත්තන්ති, කතමේ චත්තාරෝ : සප්පුරිස සංසේවෝ, සද්ධම්ම සවනං, යෝනිසෝමනසිකාරෝ, ධම්මානුධම්මපටිපත්ති" (සංයුත්ත නිකාය - පළමුවන, දෙවන, තුන්වන හා හතරවන ඵල සූත්‍ර).

මහණෙනි, මේ ධර්ම 4 වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් සෝවාන්-සකෘදාගාමී-අනාගාමී-අරහත් ඵල සාක්ෂාත් කළ හැකි ය. ඒ කරුණු හතර කුමක් ද ?

1. කල්‍යාණ මිත්‍ර, සත්පුරුෂ සංසේවනය
2. සද්ධර්මය ඇසීම
3. නුවණින් මෙනෙහි කිරීම
4. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදීම

නිර්වාණය අවබෝධ කිරීම සඳහා කල්‍යාණ මිත්‍ර සේවනය කෙතරම් අවශ්‍ය ද යන කරුණ ඔබට දැන් අවබෝධ වනු ඇත.

මෙම නිසා ම බෞද්ධයෝ මෙසේ ප්‍රාර්ථනය කිරීමට පුරුදු වී සිටිති.

"ඉමිනා පුඤ්ඤ කම්මේන - මා'මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාණ පත්තියා."

මෙම පුණ්‍ය කර්මයේ බලයෙන්, නිවන් දක්නා තුරු ම, බාල මෝඩ පාප මිත්‍ර ඇසුරක් නො ලැබේවා! කල්‍යාණ මිත්‍ර සේවනය ම ලැබේවා!